සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2019(II)**

| | | |
|---|---|---|
| කාලය: පැය 03 | වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම (08) | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................... |

- **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) යුක්ත වන අතර හයවන ප්‍රශ්නයට අදාළව ඇමුණුම 01 වශයෙන් ඇමුණුමක් ද ඇතුළත් කර ඇත.**
- **ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

---

1. ගණකාධිකාරීවරයෙකුගේ විෂය පථය තුළ පහත සඳහන් කරුණුවල වැදගත්කම පිළිබඳව කරුණු කෙටියෙන් සාකච්ඡා කරන්න.
   a) රාජ්‍ය ගිණුම්කාරක සභාව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම
   b) රාජකාරී කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය (Information Technology) භාවිතය
   c) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
   d) ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැකසීම (ලකුණු 5X4 = 20)

2. ඔබගේ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් දිස්ත්‍රික්කයේ විවිධ රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා "පවතින ආර්ථික ගැටළු හමුවේ කාර්යාලයීය මූල්‍ය කළමනාකරණයේ වැදගත්කම" යන මැයෙන් දේශනයක් පැවැත්වීමට ඔබට පවරා ඇත. මෙම දේශනය සඳහා පැය එකක (01) කාලසීමාවක් ලබා දී ඇති අතර, එහිදී ඔබ සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන ප්‍රධාන කරුණු කෙටුම්පත් කරන්න. (ලකුණු 20)

3. ආසියාතික රටවල මුදල් අමාත්‍යවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට නියමිත ආර්ථික සංවර්ධන උපායමාර්ගික සම්මන්ත්‍රණයක මූල්‍ය වගකීම් සම්බන්ධීකරණ කටයුතු සඳහා ඔබගේ නම නිර්දේශ වී ඇති අතර එහිදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු, ඒ සඳහා වගකීම දරන ආයතන හා එම ආයතනවල වගකීම සම්බන්ධයෙන් මූලික වාර්තාවක් සති දෙකක (02) කාල සීමාවක් තුළ ලබා දෙන ලෙසට ඔබට දන්වා ඇත. සුදුසු පරිදි අදාළ වාර්තාව කෙටුම්පත් කර දක්වන්න. (ලකුණු 20)

4. ඔබ සේවා ආයතනය ආපදා කළමනාකරණ කටයුතුවලදී විවිධ වූ කාර්යයන් ක්ෂණිකව මහජනතාව වෙත ලබා දීමට ස්ථාපනය කර ඇති ආයතනයක් වන අතර එම ආයතයනය සතුව විශාල වත්කම් ප්‍රමාණයක් පවතී. පසුගිය අවුරුදු 03-05 අතර කාලසීමාව තුළදී විවිධ වූ හේතු මත ආයතනයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිසි ලෙස සිදුවී නොමැති අතර, ඒ හේතුවෙන් විවිධ වූ ගැටළු උද්ගතව ඇත. මේ පිළිබඳව අවධානය යොමු කළ ඔබගේ ආයතන ප්‍රධානියා ඉහත ගැටළුව නිරාකරණය කරගැනීම සඳහා තොරතුරු තාක්ෂණික පද්ධතියක් ස්ථාපනය කළ හැකි ආකාරය පිළිබඳව අධ්‍යනය කර වාර්තාවක් ඉදිරිපත් කිරීමට ඔබට පවරා ඇත. ඒ අනුව ඉහත වාර්තාවේ අන්තර්ගත කළ යුතු කරුණු, ඔබගේ යෝජනා හා නිර්දේශ ඇතුළත් කර වාර්තාවක් සකසන්න. (ලකුණු 20)

5. විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලියේදී දිගින් දිගටම වැඩිපුර ගෙවීම් සිදුවන බවත්, එම වැඩිපුර ගෙවීම් වළක්වා ගැනීමට දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන බවත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ඔබගේ ප්‍රාදේශීය ලේකම්වරයා දැනුවත් කර ඇත. මෙවැනි ගැටළු වළක්වා ගැනීම සඳහා දැනට පවතින අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ සිදුකල යුතු වෙනස්කම් ඇතුළත් නව අභ්‍යන්තර විගණන ක්‍රමවේදයක ඇතුළත් විය යුතු ප්‍රධාන අංග සාකච්ඡා කරන්න. (ලකුණු 20)

6. ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයට බදු ආදායම දක්වන දායකත්වය පිළිබඳ ප්‍රස්ථාර 02 ක් ඇමුණුම 01 වශයෙන් දක්වා ඇත. එහි දැක්වෙන මූල්‍ය දත්ත විශ්ලේෂණය කරමින්, ලංකාවේ බදු ආදායම අඩුවීමට බලපාන කරුණු හා එමගින් පැන නැගිය හැකි අහිතකර කරුණු පිළිබඳව කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**************

**Figure 18: Composition of tax revenue as a share of GDP**
*(Percent)*




Source: Ministry of Finance, and staff calculations

*රූපය 1*

**Figure 20: Regional benchmarking of Sri Lanka's tax performance**
*(Percent of GDP)*




*රූපය 2*